# ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීම උදෙසා පවත්වන දීප ව්‍යාප්ත

# චිත්‍ර නිර්මාණ තරගාවලිය

**කාලගුණික හා දේශගුණික විපර්යාස හරහා ස්වභාවික උපද්‍රවවල තීව්‍රතාවය නිසා සිදුවන ආපදාවන් හා හානි වැඩි වෙමින් පවතී.**

**ආපදා අවදානම් කළමනාකරණයේදී පෙර සූදානම, අවම කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම කෙරෙහි වැඩි අවධානය යොමු කිරීම තුළින් ජීවිත හා දේපළ හානි අවම කර ගත හැක. එමගින් ආපදා ප්‍රතිසාධනයට (හානි යථා තත්වයට පත් කිරීමට) වැයවන ප්‍රතිපාදන රටේ සංවර්ධනයට යොදා ගත හැක.**

ආපදා අවදානම් කළමනාකරණ ක්ෂේත්‍රයෙහි නියැළී සිටින ජාතික හා ජාත්‍යන්තර ආයතන ඒකාබද්ධව, ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් (Symposium) 2020/03/16 – 2020/03/18 දිනයන් හී කොළඹ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙම ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සමගාමීව පාසල් සිසුන් තුළ ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුම අවබෝධය වැඩිදියුණු කිරීම සහ ආපදා අවදානම කළමනාකරණ ක්‍රියාවලියට පාසල් සිසුන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා දීපව්‍යාප්ත චිත්‍ර තරගාවලියක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව ක්‍රියාත්මක කෙරේ.

## චිත්‍ර නිර්මාණ තරගාවලියේ තේමා

- ආපදා ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම්
- ආපදා වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග
- ආපදා අවදානම්වලදී ලද අත්දැකීම්
- සුරක්ෂිත ප්‍රජාවක් සඳහා ආපදා අවදානම් අවමකිරීම

උක්ත තේමා යටතේ ඔබගේ චිත්‍ර නිර්මාණය සිදුකර සුදුසු මාතෘකාවක් යෙදීමට කටයුතු කරන්න.

## චිත්‍ර නිර්මාණ තරගාවලිය පැවැත්වෙන කාණ්ඩ

| කාණ්ඩ අංකය | කාණ්ඩය |
|---|---|
| 1 | 6 – 7 ශ්‍රේණි |
| 2 | 8 – 9 ශ්‍රේණි |
| 3 | 10 – 11 ශ්‍රේණි |
| 4 | 12– 13 ශ්‍රේණි |

## චිත්‍ර නිර්මාණය කරන කඩදාසියේ ප්‍රමාණය

**අඟල් - 18X14**

## චිත්‍ර නිර්මාණ සදහා භාවිත කරන මාධ්‍ය

චිත්‍ර ඇඳීම සදහා පැස්ටල් හෝ දිය සායම් මාධ්‍ය පමණක් භාවිත කළ යුතුය.

## චිත්‍ර නිර්මාණ ඇගයීම

- දිස්ත්‍රික් මට්ටම
- පළාත් මට්ටම
- සමස්ත ලංකා මට්ටම
- ජාතික මට්ටම

සමස්ත ලංකා මට්ටමින් නිර්මාණ 100 ක් තෝරා ගනු ලබයි. එම තෝරා ගනු ලබන සිසුන්100 දෙනා කොළඹට කැඳවා පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සිදු කරන නිර්මාණ අතුරින් ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් තෝරා ගනු ලැබේ.

## ත්‍යාග ප්‍රදානය

ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය පැවැත්වෙන 2020.03.16 දින සමාරම්භක අවස්ථාවේදී ප්‍රධාන ආරාධිත අමුත්තන් වෙතින් ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග හා සහතිකපත්‍ර ප්‍රදානය සිදුකෙරේ.

## ත්‍යාග පිළිබඳ විස්තර

| සෑම කාණ්ඩයකම | ත්‍යාගය |
|---|---|
| පළමු ස්ථාන (4) | රු. 30,000.00 මුදල් ත්‍යාගය හා සහතික පත්‍රය |
| දෙවන ස්ථාන (4) | රු. 25,000.00 මුදල් ත්‍යාගය හා සහතික පත්‍රය |
| තෙවන ස්ථාන (4) | රු. 20,000.00 මුදල් ත්‍යාගය හා සහතික පත්‍රය |
| සිව්වන ස්ථාන (4) | රු. 15,000.00 මුදල් ත්‍යාගය හා සහතික පත්‍රය |
| පස්වන ස්ථාන (4) | රු. 10,000.00 මුදල් ත්‍යාගය හා සහතික පත්‍රය |

- **සෑම කාණ්ඩයකම පළමු ස්ථානයේ සිට පස්වන ස්ථානය දක්වා ජයග්‍රාහකයින් 5 දෙනෙකු බැගින් තෝරා ගනු ලැබේ.**



## චිත්‍ර නිර්මාණ ඉදිරිපත් කළයුතු ආකාරය

පන්තිභාර ගුරුතුමාගේ සහ විදුහල්පතිතුමාගේ නිර්දේශ සහිත අයදුම් පත්‍රය චිත්‍ර නිර්මාණය කරන කඩදාසියේ පසුපස අලවා 2020.02.21 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අංක 120/2, විද්‍යා මාවත, කොළඹ 07 යන ලිපිනයට එවීමට කටයුතු කළ යුතුය. ලියුම් කවරයේ / චිත්‍ර නිර්මාණ ඇසුරුමේ වම්පස ඉහළ කෙලවරේ "චිත්‍ර තරඟය 2020, කාණ්ඩ අංකය...... සහ දිස්ත්‍රික්ක....." යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

## චිත්‍ර පිළිබඳ වැඩිදුර විස්තර

මෙම චිත්‍ර තරගය පිළිබඳ වැඩිදුර විස්තර සහ අයදුම්පත් www.dmc.gov.lk යන වෙබ් අඩවිය තුළින් ලබාගත හැක.

## සම්බන්ධීකරණ නිලධාරීන්

| නිලධාරියාගේ නම | භාෂා මාධ්‍ය | දුරකථන අංකය |
|---|---|---|
| ශාන් | සිංහල | 0773957902 |
| රවී | දමිළ | 0761352484 |
| සාරංගා | ඉංග්‍රීසි | 0772091597 |

## ආදර්ශ අයදුම් පත්‍රය

**සම්මන්ත්‍රණයට සමගාමීව පවත්වන**
**දීපව්‍යාප්ත චිත්‍ර තරඟය**

සම්පූර්ණ නම : ..............................

ලිපිනය : ..............................

ශ්‍රේණිය : ..............................

පාසල : ..............................

කලාපය : ..............................

දිස්ත්‍රික්කය : ..............................

දුරකථන අංකය : ..............................

චිත්‍රයේ තේමාව : ..............................

මාතෘකාව : ..............................

භාවිත කළ සායම් මාධ්‍ය : ..............................

ස්වනිර්මාණයක් බවට සහතික කරමි.

දිනය ..............................

අයදුම්කරුගේ අත්සන ..............................

ඉහත නම සඳහන් ශිෂ්‍යයා/ ශිෂ්‍යාව ..................ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත් මෙම නිර්මාණය ඔහු/ ඇය ගේ ස්වනිර්මාණයක් බවත් සහතික කරමි.

පන්තිභාර ගුරුවරයාගේ/ ගුරුවරියගේ නම..............................

දිනය ..............................

අත්සන ..............................

විදුහල්පතිතුමාගේ අත්සන හා නිල මුද්‍රාව ..............................

දුරකථන අංකය ..............................